# ශ්‍රී ලංකාවේ නිදහස ලැබූ පසු පාලනය කළ ජනාධිපතිවරු හා අගමැතිවරු

ජ්‍යෝතිෂ විශාරද හා ආයුර්වේද වෛද්‍ය
**ස්ටැන්ලි ධම්කුමාර**

| උපත | විපත | ජනාධිපතිවරු | පාලන කාලය ආරම්භය | පාලන කාලය අවසානය |
|---|---|---|---|---|
| 1896 | 1981 | විලියම් ගොපල්ලව මහතා | 1972.05.22 | 1978.02.4 |
| 1906 | 1996 | ජූනියස් රිචඩ් ජයවර්ධන මහතා | 1978.02.4 | 1988.01.02 |
| 1924 | 1993 | රණසිංහ ප්‍රේමදාස මහතා | 1989.01.02 | 1993.05.01 |
| 1916 | 2008 | ඩිංගිරිබන්ඩා විජේතුංග මහතා | 1993.05.01 | 1994.11.12 |
| 1945 | | චන්ද්‍රිකා බන්ඩාරනායක මහත්මිය | 1994.11.12 | 2005.11.19 |
| 1945 | | මහින්ද රාජපක්‍ෂ මහතා | 2005.11.19 | 2015.01.09 |
| 1951 | | මෛත්‍රිපාල සිරිසේන මහතා | 2015.01.19 | වර්තමාන |
| 1883 | 1952 | ඩී.ඇස් සේනානායක මහතා | 1947.09.24 | 1952.03.22 |
| 1911 | 1973 | ඩඩ්ලි සේනානායක | 1952.03.26 | 1953.10.12 |
| 1897 | 1980 | සර් ජෝන් කොතලාවල මහතා | 1953.10.12 | 1956.04.12 |
| 1899 | 1959 | ඇස් ඩබ්ලිව් ආර්.ඩී. බන්ඩාරනායක මහතා | 1956.04.12 | 1959.09.26 |
| 1902 | 1997 | විජයානන්ද දසනායක මහතා | 1959.09.26 | 1960.03.20 |
| 1911 | 1973 | ඩඩ්ලි සේනානායක මහතා | 1960.03.21 | 1960.07.21 |
| 1916 | 2000 | සිරිමාවෝ බන්ඩාරනායක මහත්මිය | 1960.07.21 | 1965.03.25 |
| 1911 | 1973 | ඩඩ්ලි සේනානායක මහතා | 1965.03.25 | 1970.05.29 |
| 1916 | 2000 | සිරිමාවෝ බන්ඩාරනායක මහත්මිය | 1970.05.29 | 1977.07.23 |
| 1906 | 1996 | ජූනිය රිචඩ් ජයවර්ධන මහතා | 1977.07.23 | 1978.02.04 |
| 1924 | 1993 | රණසිංහ ප්‍රේමදාස මහතා | 1978.02.06 | 1989.01.02 |
| 1916 | 2008 | ඩිංගිරි බන්ඩා විජේතුංග මහතා | 1989.03.06 | 1993.05.07 |
| 1949 | | රනිල් වික්‍රමසිංහ මහතා | 1993.05.07 | 1994.08.19 |
| 1945 | | චන්ද්‍රකා කුමාරතුංග මහත්මිය | 1994.08.19 | 1994.11.12 |
| 1916 | 2000 | සිරිමාවෝ බන්ඩාරනායක මහත්මිය | 1994.11.14 | 2000.08.09 |
| 1933 | 2016 | රත්නසිරි වික්‍රමනායක මහතා | 2000.08.10 | 2001.12.07 |
| 1949 | | රනිල් වික්‍රමසිංහ මහතා | 2001.12.09 | 2004.04.06 |
| 1945 | | මහින්ද රාජපක්‍ෂ මහතා | 2004.04.06 | 2005.11.19 |
| 1933 | 2016 | රත්නසිරි වික්‍රමනායක මහතා | 2005.11.19 | 2010.04.21 |
| 1931 | | ඩී.ඇම් ජයරත්න මහතා | 2010.04.21 | 2015.01.09 |
| 1949 | | රනිල් වික්‍රමසිංහ මහතා | 2015.01.09 | 2018.10.26 |
| 1945 | | මහින්ද රාජපක්‍ෂ මහතා | 2018.10.26 | 2018.12.15 |
| 1949 | | රනිල් වික්‍රමසිංහ මහතා | 2018.12.15 | |

1947 සිට මේ දක්වා ශ්‍රී ලංකාව විටින් විට පාලනය කළ විවිධ පාලකයන් ගේ හා ජනාධිපති වරු අගමැතිවරුන්ගේ සවිස්තරාත්මක විස්තරයක් මෙමඟින් ඔබට ප්‍රකාශ කරමි.
ඉහත වසර 72 ක කාලයක් මෙම වර්‍ග මීටර් 65610 ක් වූ මෙම මුතු කැටය වැනි දේශය විවිධ දේශපාලකයන් විසින් පාලනය කිරීම නිසා විවිධ ආර්ථික ක්‍රම භාවිතාකරමින් එකි නෙකාට අවශ්‍ය පරිදි තම තමාගේ සුබ විහරණය උදෙසාම මිස පොදු ජනයා මිස සේවය නොකළ බව පෙනේ.

ක්‍රි.වර්ෂ 1960 පසු පත්වූ විවිධ දේශපාලන පක්‍ෂයකින් විවිධ අදහස් හා අප රටට නොගැලපෙන විදේශ රටවලට ආවේනික වූ ක්‍රියාදාමයන් හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට යෑම නිසා ක්‍රි. වර්ෂ 2019 වන විට රටේ ජාතික ආදායමට වඩා වියදම් වැඩිවීම හා ලෝක බලපෑමෙන් විටෙන් විට වීජිය ක්‍රියාමාර්ම අනුගමනය කිරීමට දුන් උපදෙස් මගින් රටේ ආර්ථිකය කඩා වැටීම නිසා අද වන විට දරා ගත නොහැකි ණය බරකට රට පත් වී ඇති බව පෙනේ. ඒ සමඟම අපට පෙනී යන කාර්යය නම් පසුගිය 50 වසරේම එක්සත් ජාතික පක්‍ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය විසින් තට්ටු මාරු ක්‍රමයට වසර 5 ක් හෝ 10 බැගින් රට පාලනය කිරීම නිසා එකම පවුල් 4 ක පිරිසක් විටෙන් විට පක්‍ෂ මාරු කිරීම මඟින් රටේ සම්පත් සූරාකෑම හා මුදල්ද අවභාවිතා කරමින් රට රාජ්‍ය වල හා විවිධ බැංකුවල මිල මුදල් හා දේපල ආයෝජනය කරමින් අදටද ඉතා සමීප මිත්‍ර ලීලාවෙන් රට විනාසය කරා ගෙනයති. මේ බව අප අහිංසක ජනතාව දැන සිටියත් අලුත් දේශපාලන පක්‍ෂයකට හෝ අලුත් අවංක පුද්ගලයන්ට අප ශ්‍රී ලංකාව පාලනය කිරීමට බලයක් ලබා ගැනීමට අපහසු බව පෙනී යනු ඇත.

හේතුව දේශපාලනයට පිවිසෙන ඕනෑම කෙනෙකුට ඉතා විශාල  කෝටි ගණනක මිල මුදලක් අවශ්‍ය බවද මැර බලය, ආයුධ මත්පැන්, මත්ද්‍රව්‍ය හා හමුදා සහයද අවශ්‍ය වනු ඇත.

තවද නීතිය ද, පාලනය කළ හැකි බලයද අවශ්‍ය යි. මේ හේතු සලකා බැලීමේ දී 2030 වන විට ඇමරිකාව හෝ ඉන්දියාව හෝ චීනය අප රට සම්පූර්ණයෙන් ගිල ගනු ඇත. ඉන්පසු ඔවුන්ගේ දේශපාලන දූෂිතයන් යොදා රටේ සම්පත් හා මුදල් දේපල ද ඉදිරියේ ද පැවැත්වීමට නියමිත මහ මැතිවරණය හා ජනාධිපති මැතිවරණය ද සලකා බැලීමේ දී එකම දූෂිත පාලකයන් පිරිසක් විසින් සම්මුතියක් අත්සන් කරමින් දෙපිරිසකට බෙදා ගෙන ආපසු අහිංසක අන්ත අසරණ ජනතාව රවටා ඡන්ද බලය ලබා ගෙන නැවතත් දූෂණය , මංකොල්ලය හා මැරබලය යොදා තම පවුල් හා නෑයන්, හිතමිත්‍රයන් පෝෂණය කිරීමට මඟ සාදා ගනී.

රජයේ සිටින ඇමති කෙනෙකු විසින් ප්‍රකාශ කරන පරිදි පාර්ලිමේන්තුවේ පක්‍ෂ 2 සිටින මන්ත්‍රීවරුන් 225 න් 100 දෙනෙකුට මත්ද්‍රව්‍ය හා මත්පැන් ශාලා බලපත්‍ර ඇති බවත්, 70 දෙනෙකුට ගංඟා, වැව්, මුහුදෙන් වැලි ගොඩ දමා විකිනීමට බලපත්‍ර දී ඇති බවත්, මත්ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීමට හා මත්පැන් සෑදීමට ගන්නා මෙතනෝල් නම් ද්‍රව්‍ය ආනයනය කිරීමට බදු නිදහස සමඟ බලපත්‍ර දුන් මන්ත්‍රීවරු 11 දෙනෙකුද, සිංහ රාජ වනාන්තරයෙන් අක්කර 100 බැගින් සියලුම මන්ත්‍රී ඇමතිවරුන්ට ද පරිත්‍යාග කර ඇති අතර සියලු දෙනාටම වාහන බදු රහිත බලපත්‍ර 225 දෙනාටම වසර 2 වරක් පරිත්‍යාග කිරීම නිසාද සෑම මැති ඇමති වරු හා මන්ත්‍රීවරු මිය යනතුරු මෙහි ගැලී වෙලී සිටීමට උත්සාහ කරයි.

ඉදිරි දශක කීපයද පියාගෙන්, පුතාටද, බිරිඳට ද, දුවටද, බෑනාටද, තට්ටුමාරු ක්‍රමයට හා පක්‍ෂ මාරු කිරීමට රට පාලනය කරනු ඇත. ප්‍රබල පක්‍ෂ දෙකේ ලාංජනය හා පාට මාරු කිරීම හා මුහුණ මාරු කර යෑම තුලින් ඊට සම්පූර්ණයෙන් විනාශ මුඛයට යනු ඇත. බුද්ධ ශාසනය ද , සිංහල, මුස්ලිම්, දෙමළ හා අනෙකුත් ජාතීන් ද විටෙ න් විට රැවටීම් වලට ද ගොදුරු කර සමහර මන්ත්‍රීන් හා ඇමතිවරු පන්සල් භූමිද, දේවාල භූමි ද, රජයට පවරා ගන්නා මුවා වෙන් එම ස්ථාන පාලු ප්‍රදේශවලට මාරුකර වටිනා ඉඩම් හොර ඔප්පු ලියාගෙන ප්‍රකෝටි ගණන් වටිනා ඉඩකඩම් බලෙන් පවරාගෙන වැඩි මිලට විකුණා මුදල් ලබාගැනීමේ ජාවාරමක නියැලී සිටී.

